1089

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා මහ බැංකුවට කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2007

## (02) විශ්ලේෂණාත්මක ලිවීම

පැ දෙකයි

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

---

1. පහත සඳහන් මාතෘකා අතුරෙන් **එකක්** තෝරාගෙන විශ්ලේෂණාත්මකව හා විවේචනාත්මකව ඔබේ අදහස් ඉදිරිපත් කරමින් වචන 300 ක් පමණ වනසේ රචනයක් ලියන්න.

   (අ) අධ්‍යාපන ප්‍රතිපත්තියේ දඩි අපේක්ෂාව විය යුත්තේ සහජ කුසලතාවෙන් යුත් අයට හානියක් නොවන පරිදි සමාජ අසාධාරණය තුනී කරලීමයි.

   (ආ) මනුෂ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කළ සමාජයන් විසින් සිදු කර ඇත්තේ මිනිසා වඩාත් අසරණ තත්ත්වයට ඇද දමීමයි.

   (ඉ) 'ආගමට අයත් ස්ථානය හිමිකර ගන්නේ සාහිත්‍යයයි'. මැතිව් ආර්නෝල්ඩ්

   (ඊ) ජනමාධ්‍යයේ අරමුණ විය යුත්තේ කාලීන වාර්තා තොරතුරු මගින් මහජනතාව දැනුවත් කිරීම හා විනෝදස්වාදය සැපයීම පමණක් නොව ඔවුන්ගේ සාමාන්‍ය අවබෝධය ඉහළ නැංවීමට ද ක්‍රියා කිරීමයි.

   (උ) රාජ්‍ය බැංකු සමග සැසඳීමේදී රටේ සංවර්ධනය උදෙසා පුද්ගලික බැංකු මගින් ඉටු විය යුතු කාර්ය භාරය.

2. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

   වෙළෙඳපොල ආර්ථික රාමුවක් තුළින් පූර්ණ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට ලංකාව අසමත් වීමට ප්‍රධාන සාධක තුනක් හේතු වී ඇති බව පැහැදිලි වේ. එනම්, අධික වියදම් සහිත සහ විනාශකාරී අභ්‍යන්තර අරගල දීර්ඝතම පැවතීම, එතරම් හිතකර නොවන සාර්ව ආර්ථික වාතාවරණය සහ ආර්ථික ලිහිල්කරණය සහ අනෙකුත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල මන්දගාමී ප්‍රගතියයි.

   සාමය සහ ආර්ථික වර්ධනය නොවැළැක්විය හැකි පරිදි එකිනෙකට සම්බන්ධ ව ඇති බැවින් සාමය ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය බව මෑත කාලීන අත්දැකීම්වලින් නැවත පෙන්නුම් කර ඇත. රට වර්තමානයෙහි මුහුණ පා ඇති ප්‍රධාන අභියෝගය වන්නේ මෙම අරමුණු දෙකම එකවර සාක්ෂාත් කර ගැනීමයි. රජය මෙම අභියෝගය පැහැදිලි ව හඳුනාගෙන තිබීමත්, මෙම අංග දෙකෙන් ම ඉදිරියට යාමට අධිෂ්ඨාන කර ගෙන තිබීමත් දිරි ගන්වන සුළු ය. උතුරු හා නැගෙනහිර ගැටලුව පිළිබඳ දේශපාලන විසඳුමක් සඳහා ජාතික ඒකමතිකභාවයක් ගොඩ නගන අතර ම තිරසාර සාමයක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය දේශීය හා ජාත්‍යන්තර සහාය ඒකරාශී කිරීමට රජය දැඩි ඇප කැපවීමකින් ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු ජනවාර්ගික කොටස්වලට පිළිගත හැකි විසඳුමක් කරා ළඟා වනතුරු සාම ක්‍රියාදාමය වේගවත් ව ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතු ය.

   ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලු හා අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ දිගුකාලයක් මුළුල්ලේ හඳුනා ගෙන පුළුල් සාකච්ඡාවට භාජනය කොට ඇත. එහෙත් ඒවා පිළිගැනීම හා ක්‍රියාත්මක කිරීම කෙටි කාලීන දේශපාලන අවශ්‍යතාවන් හේතු කොට ගෙන ප්‍රමාද වෙමින් පවතී. මෙම තත්ත්වය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි දක්වන අවධානය සහ කැපවීම පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් ඉස්මතු කර ඇත. ඒ අනුව, ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට, අවබෝධාත්මක ජාතික එකඟතාවක් සහ දැඩි කැපවීමක් අතිශයින් අවශ්‍ය වේ. අවශ්‍ය ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ විස්තීර්ණ හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතින ඒවා ය. එම නිසා, මේවායේ ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා ප්‍රතිපත්ති නිසි පරිදි පෙළ ගැස්වීම, පරස්පර විරෝධී නොවන බව සහ අඛණ්ඩ ව ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම අවශ්‍ය වේ. කාර්යක්ෂම හා ගතික රාජ්‍ය අංශයක අවශ්‍යතාව පවත්නා අතර එහි කාර්යභාරය විය යුත්තේ ආර්ථික කටයුතුවලට මැදිහත් වනවාට වඩා පහසුකම් සලසන්නකු ලෙස ක්‍රියා කිරීම ය. මෙය ඉතා කාර්යක්ෂම හා ගතික පෞද්ගලික අංශයක සංවර්ධනයට ඉඩ සලසන අතර එවැනි පෞද්ගලික අංශයක් සිය කාර්යක්ෂමතාව, කළමනාකරණ හැකියාව හා නව සොයා ගැනීමේ හැකියාවන් පදනම් කොට ගෙන ආර්ථිකය වර්ධනය කරා මෙහෙයවනු ඇත.

[ 2 වැනි පිටුව බලන්න.

සේවා නියුක්ති කාර්යාංශය මගින් මෙම අයිතීන් සුරැකීමට යෑමේ දී රැකියා අවස්ථා අහිමි නොකර ගැනීමට වග බලා ගත යුතු වන්නේ ශ්‍රමිකයින් යොදා ගන්නා රටවල් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සමඟ ද්විපාර්ශ්වික එකඟත්වයකට පැමිණීමට අකැමැති හෙයිනි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් මැදිහත්ව කටයුතු කරන ක්‍රියා මාර්ග දියුණු කිරීමට අවශ්‍ය ද්විපාර්ශ්වික එකඟතා ඇති කිරීම මගින් සේවා ස්ථානවල දී සිදු වන හිරිහැර අවම කර ගත හැකි වන අතර එමගින් පසුගිය කාලවල සිදු වූ අවාසනාවන්ත සිද්ධීන් වළක්වා ගත හැක.

**සිද්ධි අධ්‍යයනය**

4. 'සමනල ආයෝජකයෝ' යනු ලාභ පෙරදැරි කොටගත් පුද්ගලික සමාගමකි. මෙහි මුළු සේවක සංඛ්‍යාව 75 නොඉක්මවයි. පරිපාලනය අවධානය යොමු කරන්නේ හොඳ ප්‍රතිඵල හා ලාභ ලබා ගැනීමත් සාම්ප්‍රදායික වෙළඳ සමාගමක් තුළ පවත්නාවූ පන්ති පරතරය අඩු කිරීමත් සඳහාය.

ශ්‍රිමල් විජේසිංහ තරුණ කලා උපාධිධාරියෙකි. උපාධිධාරී හා අ.පො.ස. උ.පෙළ. සමත් ගැමි හා නාගරික තවත් තරුණයන් හා තරුණියන් සමග ඔහු මෙහි සේවය කරයි. ඔහුගේ අපේක්ෂාව වනුයේ තමන්ගේ රැකියාව වැඩිදුර දියුණු කර ගැනීමත් තමාට සමාජයෙහි තැනක් ලබා ගැනීමත් ය. ආරම්භයේදී සම්ප්‍රදායානුකූලව තමාට ලැබුණු පහත් මට්ටමේ වැඩ කටයුතු කිරීමට ඔහු කැමැත්තෙන්ම ඉදිරිපත් විය. අන්‍ය සේවකයන්ට ස්ටෝරුවේ බඩු අසුරාලීම වැනි වැඩ ලැබුණත් ඔහුට සිදුවූයේ පහත් ගණයේ වැඩවල යෙදීමට ය. ශ්‍රිමාල් මේ තත්ත්වය ගැන කළකිරී ඇත. මේ රැකියා ස්ථානය අතහැර යාමට ඔහු බලාපොරොත්තු වේ. ශ්‍රිමාල් වගකීම් සහිත කාර්යශූර සේවකයෙකි. ඔහුගේ ඉවත්වීම මේ සමාගමට ද පාඩුවකි.

1. ශ්‍රිමාල් මුහුණ පා ඇති ගැටලුව හඳුන්වන්න.
2. ශ්‍රිමාල්ට උපකාර කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන නිර්දේශ මොනවා ද?

❋ ❋ ❋

3. ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය පිළිබඳ ව සපයා ඇති පහත දැක්වෙන මැංකු වාර්තා දෙක කියවා එහි සමාන හා අසමාන කරුණු සංසන්දනය කරමින් වචන 150ක් පමණ වන සේ සංක්ෂිප්ත හා විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

(අ) 2001 වසරේ දී බාධක මධ්‍යයේ වුව ද විදේශ සේවා නියුක්තියේ ක්‍රමවත් දියුණුවක් දක්නට ලැබුණි. 2001 ජූලි මාසයේ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරය නිසා ඇති වූ අහස් යානා ප්‍රමාණය සීමාවීම සහ ගුවන් ගමන්වල අඩුවීම හා ඇමෙරිකාව වෙත එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව නැවත මැද පෙරදිග යුද්ධයක් ඇති වේ යැයි වූ බිය 2001 වසරේ දී මෙම අංශයේ ඇති වූ මූලික බාධක ලෙස සැලකිය හැක. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති (ශ්‍රී.ලං.වි.සේ.නි.) කාර්යාංශයට අනුව 2001 වසරේ දී ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන් 184 000 පමණ වූ අතර මෙය සංසන්දනාත්මකව 2000 වසරේ දී 181 000 විය. තව ද 2001 දී මුළු විදේශ රැකියා නියුක්තිය අපේක්ෂිත අගය වූ 183 750 ඉක්මවා ගිය අතර මෙයට ප්‍රධාන හේතුව වූයේ අදාළ පාර්ශ්වයන්ගේ කාලෝචිත මැදිහත්වීම සහ පරිශ්‍රමය නිසා බාහිර කම්පනවලින් ඇති වූ බාධක අවම කර ගැනීමයි.

2001 වසරේ දී බලය ලත් විදේශ රැකියා සැපයීමේ ආයතන 83 කින් වැඩි වූ අතර, මුළු ආයතන ගණන 528 ක් විය. එමෙන් ම බලය ලත් විදේශ රැකියා සැපයීමේ ආයතන මගින් සැපයූ රැකියාවල ප්‍රතිශත දායකත්වය 2001 දී සියයට 72 දක්වා වැඩි වූ අතර මෙය 2000 වසරේ දී සියයට 70 ක් විය. මෙලෙස බලය ලත් විදේශ රැකියා ආයතන කෙරෙහි විශ්වාසය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය මගින් එම ආයතනයන්ට අදාළ නීතිමය රාමුව වැඩි දියුණු කිරීම සහ ඒවා අධීක්ෂණයට ලක් කිරීමයි.

ශ්‍රී ලංකාව දියුණු රටවල ඇති ඵලදායිතාවයෙන් වැඩි විදේශ සේවා අවස්ථාවන් සොයා යෑම කළ යුතු කාර්යයක් වී ඇත. පරිගණක වැඩ සටහන් නිෂ්පාදකවරුන් හා හෙදියන් වැනි පුහුණු ශ්‍රමිකයන් සඳහා දියුණු රටවල ශ්‍රම වෙළෙඳපොළෙහි හොඳ ඉල්ලුමක් නොකඩවාම පවතී. මෙම රැකියා අවස්ථාවන් ලබා ගැනීම නොහැකි වී යාමට හේතු වී ඇත්තේ ඉංග්‍රීසි වැනි ජාත්‍යන්තර භාෂා පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහ අදාළ තාක්ෂණික සුදුසුකම් නැතිවීම ය. එහෙත් වත්මන් ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ රටවල් අතර ශ්‍රම ගලනයට වූ බාධා නැති වී යමින් පැවතීම නිසා මෙවැනි රැකියා වෙළෙඳපොළවල් කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම විශේෂයෙන් තරුණයින්ගේ සේවා වියුක්ති ගැටලුව අවම කිරීමේ එක් උපාය මාර්ගයක් වනු ඇත. එම නිසා රැකියා විරහිත උගත් තරුණයන්හට මෙම වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පුහුණුවක් රජයේ යෝජිත පුහුණු වැඩ මුළු මගින් ලබාදීම තුළින් ඔවුන් මෙම නව රැකියා වෙළෙඳපොළ කෙරෙහි යොමු කරවීම අතිශය වැදගත් වනු ඇත.

(ආ) පසුගිය වර්ෂය සමඟ සසඳන විට 2002 වර්ෂය තුළ විදේශ සේවා නියුක්තිය පැහැදිලි වර්ධනයක් දක්නට ලැබිණි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව 2002 වසරේ ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන් 204 000 ක් වූ අතර මෙය සංසන්දනාත්මකව 2001 වසරේ 184 000 ක් විය. 2001 වර්ෂයේ පළමු භාගයේ රැකියා සඳහා පිට වී යාම 87 000 ක් හා සසඳන විට 2002 වර්ෂයේ පළමු භාගයේ දී ආන්තික ලෙස ඉහළ අගයක් වූ 90 000 ක් පමණ වුව ද, දෙවන භාගයේ දී බලාපොරොත්තු වූ 108 000 ට වඩා වැඩි වී එය 114 000 ක් විය. සංසන්දනාත්මකව 2001 දෙවන භාගයේ දී රැකියා සඳහා පිට වී ගිය සංඛ්‍යාව 97 000 කි. විදේශ රැකියා සඳහා වැඩි ඉල්ලුම හා 2001 ජූලි මාසයේ ත්‍රස්ත ප්‍රහාරය නිසා ඇති වූ ගුවන් ගමන් අඩුවීම වැනි සිදුවීම් දක්නට නොලැබීම 2002 වර්ෂයේ දෙවැනි භාගයේ දී විදේශ රැකියා සඳහා පිටවීම වැඩි වීමට හේතු විය.

2002 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටව ගිය මුළු පිරිස අතරින් ස්ත්‍රීන්ගේ දායකත්වය සියයට 65 ක් වූ අතර ශ්‍රම කාණ්ඩ අතරින් ගෘහ සේවිකාවන්ගේ දායකත්වය සියයට 53 ක් විය. විදේශ රැකියා නියුක්තිකයන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ඉපැයීම රටෙහි විශාලතම ශුද්ධ විදේශ විනිමය ලබා දෙන අංශය වන අතර මුළු විදේශ සේවා නියුක්තියෙහි ගෘහ සේවිකාවන්ගේ දායකත්වය ඉතා ඉහළ අගයක පවතී. මෙලෙස ගෘහ සේවිකාවන් මත රැඳා පැවතීම සහ වෙනත් රටවලින් ගෘහ සේවක ඇතුළත්වීම පිරවීම නිසා වැඩි වන තරඟකාරිත්වය හමුවේ ගෘහ සේවිකාවන්ගේ සේවා උසස් මට්ටමකට වර්ධනය කිරීම හා ගෘහ සේවිකාවන් වෙනත් ශ්‍රම කාණ්ඩ සඳහා යොමු කිරීම උදෙසා නිපුණතා පුහුණුව ලබා දීමට කටයුතු කළ යුතුයි. කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව ගෘහ සේවිකාවන් සඳහා පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර මේවා මගින් ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරිත්වයක් ලබා ගැනීම හා නිපුණතා පුහුණු මධ්‍යස්ථාන මගින් ගෘහ සේවිකාවන් සඳහා පුහුණුව ලබා දී ඔවුන් වෙනත් පුහුණු රැකියා සඳහා යොමු කිරීම 2002 වර්ෂය තුළ දී සිදු කෙරිණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝගය වනුයේ සංක්‍රමණික සේවකයන්ගේ සේවා ස්ථානවල ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරවීම ය. එක් අතකින් ශ්‍රී ලංකා විදේශ

( 3 වැනි පිටුව බලන්න

සේවා නියුක්ති කාර්යාංශය මගින් මෙම අයිතීන් සුරැකීමට යෑමේ දී රැකියා අවස්ථා අහිමි නොකර ගැනීමට වග බලා ගත යුතු විදේශ ශ්‍රමිකයින් යොදා ගන්නා රටවල් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සමඟ ද්විපාර්ශ්වික එකඟතාවයකට පැමිණීමට අකැමැති හෙයිනි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් මැදිහත්ව කටයුතු කරන ක්‍රියා මාර්ග දියුණු කිරීමට අවශ්‍ය ද්විපාර්ශ්වික එකඟතා ඇති කිරීම මගින් සේවා ස්ථානවල දී සිදු වන හිරිහැර අවම කර ගත හැකි වන අතර එමගින් පසුගිය කාලවල සිදු වූ අවාසනාවන්ත සිද්ධීන් වළක්වා ගත හැක.

**සිද්ධි අධ්‍යයනය**

4. සමනල ආයෝජකයෝ යනු ලාභ පෙරදැරි කොටගත් පුද්ගලික සමාගමකි. මෙහි මුළු සේවක සංඛ්‍යාව 75 නොඉක්මවයි. පරිපාලනය අවධානය යොමු කරන්නේ හොඳ ප්‍රතිඵල හා ලාභ ලබා ගැනීමත් සාම්ප්‍රදායික වෙළඳ සමාගමක් තුළ පවත්නාවූ පන්ති පරතරය අඩු කිරීමත් සඳහාය.

ශ්‍රිමල් විජේසිංහ තරුණ කුලා උපාධිධාරියෙකි. උපාධිධාරී හා අ.පො.ස. උ.පෙළ. සමත් ගැමි හා නාගරික තවත් තරුණයන් හා තරුණියන් සමඟ ඔහු මෙහි සේවය කරයි. ඔහුගේ අපේක්ෂාව වනුයේ තමන්ගේ රැකියාව වැඩිදුර දියුණු කර ගැනීමත් තමාට සමාජයෙහි තැනක් ලබා ගැනීමත් ය. ආරම්භයේදී සම්ප්‍රදායානුකූලව තමාට ලැබුණු පහත් මට්ටමේ වැඩ කටයුතු කිරීමට ඔහු කැමැත්තෙන්ම ඉදිරිපත් විය. අනෙ සේවකයන්ට ස්ටෝරුවේ බඩු අසුරාලීම වැනි වැඩ ලැබුණත් ඔහුට සිදුවූයේ පහත් ගණයේ වැඩවල යෙදීමට ය. ශ්‍රිමාල් මේ තත්ත්වය ගැන කලකිරී ඇත. මේ රැකියා ස්ථානය අතහැර යාමට ඔහු බලාපොරොත්තු වේ. ශ්‍රිමාල් වගකීම් සහිත කාර්යශූර සේවකයෙකි. ඔහුගේ ඉවත්වීම මේ සමාගමට ද පාඩුවකි.

1. ශ්‍රිමාල් මුහුණ පා ඇති ගැටලුව හඳුන්වන්න.
2. ශ්‍රිමාල්ට උපකාර කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන නිර්දේශ මොනවා ද?

❋ ❋ ❋

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka**

ශ්‍රී ලංකා මහබැංකුවේ I වන පන්තියේ මාණ්ඩලික නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය - 2004

## විශ්ලේෂණාත්මක ලේඛනය

පැ දෙකයි

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

---

1. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **එකක්** තෝරා ගෙන විශ්ලේෂණාත්මකව හා විවේචනාත්මකව ඔබේ අදහස් ඉදිරිපත් කරමින් වචන **200** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

(අ) ශ්‍රී ලංකාවේ දේශපාලනමය ප්‍රවණතා යොමු වී ඇත්තේ ජාතික සමගිය හා රටේ සංවර්ධනය උදෙසා ද?

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ සදාචාරාත්මක උත්කෘෂ්ට ගුණාංගයන්හි පරිහානිය වළක්වාලීම සඳහා පිළියම් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග

(ඇ) ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාදායක රාමුව තුළ රැඳී සිටිමින් බලය විමධ්‍යගත කිරීමේ කාර්යය සිදු කළ හැකි ද?

(ඈ) ඉරාක යුද්ධය හා එමගින් ලෝකයේ ඕනෑම රටවල් දෙකක දේශපාලනික හා ආර්ථික සංවර්ධන කටයුතු කෙරෙහි ඇති වූ බලපෑම

(ඉ) ක්‍රීඩාවල යෙදිය යුත්තේ ගර්වය, තරඟකාරීත්වය හෝ මූල්‍ය ප්‍රතිලාභ උදෙසා නොවේ. පුද්ගල දියුණුව හා විනෝදය ළඟා කර ගැනීම උදෙසාය

(ඊ) ලෝක බැංකුව හා එමගින් ණයවන ලෝකයේ රටවල පැවැත්ම හා සංවර්ධනය කෙරෙහි ඇති වන බලපෑම

(උ) ස්ත්‍රීත්ව වාදය : ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂයේ සමගිය හා අන්‍යොන්‍ය අවබෝධය කෙරෙහි මෙය තර්ජනයක් විය හැකි ද?

2. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. සාරාංශයේ ඔබ යෙදූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ වෙනත් රටවල අත්දැකීම්වලින් පෙනී යන්නේ තිරසාර සහ ගුණාත්මක වශයෙන් ඉහළ ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා සුදුසු ආර්ථික ප්‍රතිපත්ති රාමුව කුමක් ද යන්න තීරණය කිරීම ඉතා වැදගත් ආර්ථික තීරණය වන බවයි. මේ සම්බන්ධයෙන් වෙළෙඳපොළාභිමුඛ ප්‍රතිපත්ති රාමුව හොඳම විකල්පය බවට පැහැදිලිව ම පිළිගෙන ඇත. වෙනත් විකල්ප ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ වෙනත් රටවල අසාර්ථක වී ඇති බැවිනි. ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමේ දී පුළුල් ජනතා සහයෝගයක් ලබා ගැනීම සඳහා සහ ආර්ථික නොවන අරමුණු සමග ඇති විය හැකි ගැටුම් අවම කිරීම සඳහා රටට ආවේණික සුවිශේෂී තත්ත්වයන් ද සැලකිල්ලට ගත යුතු බව පිළිගෙන ඇත. කෙසේ වෙතත්, රටට ආවේණික සුවිශේෂ ලක්ෂණයන් ද වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති රාමුව සමග එහි මූලික න්‍යායයන්ට හානියක් නොවන පරිදි ඒකාබද්ධ කළ යුතුය. ප්‍රධාන ආර්ථික තීරණ අතර වන කුමක් නිෂ්පාදනය කරන්නේ ද කෙසේ නිෂ්පාදනය කරන්නේ ද සහ කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද යන තීරණ ගැනීමේ දී මූලික වශයෙන් මිල සංඥා ඇතුළු වෙළෙඳපොළ බලවේගවලට ඉඩකඩ සැලසීම යන මූලික ආර්ථික සිද්ධාන්තවලට හානියක් නොවිය යුතුය. ඕනෑම රජයේ මැදිහත් වීමක් වෙළෙඳපොළ යටපත් කරන ප්‍රතිපත්තිවලට වඩා හැකිවිට ම වෙළෙඳපොළ දිරිගන්වන තිරි යාන්ත්‍රණයක් තුළින් සිදු විය යුතුය. ප්‍රධාන වශයෙන් තරඟකාරී නොවන ආර්ථික කටයුතු පැවතීම හේතුවෙන් වෙළෙඳපොළ ක්‍රමයක් තුළ ඇතිවිය හැකි අඩුපාඩු වළක්වා ගැනීම සඳහා විලැයි සහ කාර්යක්ෂම නියාමන ක්‍රම ඒ සමගම ඇති කිරීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාව 1977 දී වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් පිළිගැනීමට නිවැරදි තීරණයක් ගනු ලැබූ අතර, මුලින්ම එවැනි තීරණයක් ගනු ලැබූ දකුණු ආසියානු රට ද විය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්ති හඳුන්වා දී වර්ෂ 25 ක් ඉක්ම ගොස් පැවතිය ද, වෙළෙඳපොළාභිමුඛ ප්‍රතිපත්ති රාමුවක ඇති මූලික සිද්ධාන්තවලට සැසඳෙන පරිදි එවැනි ක්‍රමයක තිබිය යුතු සමහර අත්‍යවශ්‍ය අංග නිසි පරිදි මෙතෙක් ප්‍රතිසංස්කරණයට ලක් වී නොමැත. මේ නිසා රටට ලැබිය යුතු උපරිම ප්‍රතිලාභ සීමා වී ඇත. මේ අතර වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තියක මූලිකාංග පසුකාලීනව ක්‍රියාත්මක කළ දකුණු ආසියානු කලාපයේ සමහර රටවල් ශ්‍රී ලංකාව ද අභිබවා යමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමටත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත් සමත් වී ඇත.

3. පහත දැක්වෙන ප්‍රශ්න අතුරෙන් එකකට පිළිතුරු සපයන්න.

(i) ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විදේශීය බැංකුවකට අවශ්‍ය වේ. තුන් වන ලෝකයේ බැංකු ක්‍රම පිළිබඳ ව යථෝක්ත බැංකුව මගින් වාර්ෂිකව පළ කෙරෙන වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා මේ තොරතුරු අවශ්‍ය වී ඇත. මේ ඉල්ලීමට පිළිතුරක් වශයෙන් වචන **150** ක් පමණ වන පරිදි විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

(ii) විදේශීය විශ්වවිද්‍යාලයක පර්යේෂණ කටයුතුවල නියැළීම සඳහා ඔබට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කර ඇත. මේ සඳහා අභිමත විෂය ක්ෂේත්‍රයක් යටතේ පිළියෙල කළ පර්යේෂණ සැලැස්මක් ඉදිරිපත් කිරීමට ඔබට සිදු වේ. ඔබේ පර්යේෂණ විෂය ක්ෂේත්‍රය, එහි වැදගත්කම, ක්‍රම විද්‍යාව හා ප්‍රයෝජන පිළිබඳ තොරතුරු ඇතුළත් කොට වචන **150**ක් පමණ වන පරිදි විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

***

3. Read the following extracts from two Central Bank reports marked (a) and (b) about the Health Service of Sri Lanka and prepare a condensed analytical report **in about 150 words**, comparing and contrasting the similar and dissimilar aspects in their contents.

(a) Sri Lanka has a widespread network of health care institutions, largely run by the state and supported by the private sector. The continuous provision of public health care services free of charge and the implementation of generous social welfare programmes by successive governments for decades have resulted in a significant improvement in the health status of people of the country. In terms of health indicators, Sri Lanka's achievements have been well above those with comparable per capita incomes. However, Sri Lanka's health sector at present is faced with new challenges in the wake of a major demographic transition, rapidly changing life styles and deteriorating environmental conditions. As identified by the health authorities, the major health problems are the following: inequities in the provision of health services, health needs of the elderly and the disabled, increased incidence of non-communicable diseases, accidents, suicides substance abuse and malnutrition. The resurgence of previously eradicated diseases such as Malaria and Tuberculosis and the frequent outbreak of new diseases such as Japanese Encephalities (JE) and Dengue Haemorrhagic Fever (DHF) have also become areas of concern. Further, Sri Lanka is a high-risk country for HIV infection although at present, its prevalence is low. The major health facilities in the country are congested and the occupancy rates in most public hospitals are over 100 per cent. The Presidential Task Force (PTF) in 1997 recommended major reforms to meet these challenges. However, under-funding, lack of a clear health sector policy in respect of both public and private sector services, organisational problems, a shortage of trained health personnel and inadequate commitment to keep the reforms implemented continue to remain as major issues in the health sector.

(b) The broad aim of Sri Lanka's health policy is to increase life expectancy and to improve the quality of life by controlling preventable diseases through health promotion activities. Five strategic objectives have been set to achieve the mission of the Ministry of Healthcare and Nutrition. These strategic objectives are: to ensure the delivery of comprehensive health services, which reduce the disease burden and promote health; to empower communities to actively participate in maintaining their health; to improve human resources for health development and management; to improve health financing, resource allocation and utilization and to strengthen stewardship and management functions of the health system. In attempting to achieve these objectives, the government provides health care free of charge to the entire population, whereas the private sector operates a fee-based system.

The sustainability of health sector achievements is threatened by several developments. The major problems include untargeted spending by the government, insufficient investment in health infrastructure and equipment, budgetary constraints, labour disputes, insufficient trained health personnel and weak preventive health care services. These have caused a series of problems ranging from a high level of malnutrition among children and pregnant women, the resurgence of communicable diseases such as malaria and dengue, and an increase in non-communicable diseases such as heart diseases, diabetes and hypertension. Mental illness, substance abuse, depression, suicides and accident are also on the increase. Emerging issues include aging problems and deteriorating health care for the elderly and the disabled. Reforms proposed to address major issues in the health sector have been implemented to a certain extent. The Presidential Task Force set up in 1997 recommended a series of measures to overcome major problems in the health sector. Out of these recommendations five thrust recommendations have been identified for immediate implementation. These are improving at least one hospital in each district, expanding services to areas of special needs, developing health promotional programmes, reforming the organisational structure including alternative financing mechanisms and promoting resource sharing with the private sector. Accordingly, 36 hospitals have been identified across the country and steps have been taken for their phased out development.

*(25 marks)*

[*See page three*

3. ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය පිළිබඳ ව සපයා ඇති පහත දැක්වෙන බැංකු වාර්තා දෙක කියවා එහි සමාන හා අසමාන කරුණු සංසන්දනය කරමින් වචන 150 ක් පමණ වන සේ සංක්ෂිප්ත හා විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

(අ) 2001 වසරේ දී බාධක මධ්‍යයේ වුව ද විදේශ සේවා නියුක්තියේ ක්‍රමවත් දියුණුවක් දක්නට ලැබුණි. 2001 ජූලි මාසයේ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරය නිසා ඇති වූ අහස් යානා ප්‍රමාණය සීමාවීම සහ ගුවන් ගමන්වල අඩුවීම හා ඇමෙරිකාව වෙත එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව නැවත මැද පෙරදිග යුද්ධයක් ඇති වේ යැයි වූ බිය 2001 වසරේ දී මෙම අංශයේ ඇති වූ මූලික බාධක ලෙස සැලකිය හැක. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති (ශ්‍රී.ලං.වි.සේ.නි.) කාර්යාංශයට අනුව 2001 වසරේ දී ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන් 184 000 පමණ වූ අතර මෙය සංසන්දනාත්මකව 2000 වසරේ දී 181 000 විය. තව ද 2001 දී මුළු විදේශ රැකියා නියුක්තිය අපේක්ෂිත අගය වූ 183 750 ඉක්මවා ගිය අතර මෙයට ප්‍රධාන හේතුව වූයේ අදාළ පාර්ශවයන්ගේ කාලෝචිත මැදිහත්වීම සහ පරිශ්‍රමය නිසා බාහිර කම්පනවලින් ඇති වූ බාධක අවම කර ගැනීමයි.

2001 වසරේ දී බලය ලත් විදේශ රැකියා සැපයීමේ ආයතන 83 කින් වැඩි වූ අතර, මුළු ආයතන ගණන 528 ක් විය. එමෙන් ම බලය ලත් විදේශ රැකියා සැපයීමේ ආයතන මඟින් සැපයූ රැකියාවල ප්‍රතිශත දායකත්වය 2001 දී සියයට 72 දක්වා වැඩි වූ අතර මෙය 2000 වසරේ දී සියයට 70 ක් විය. මෙලෙස බලය ලත් විදේශ රැකියා ආයතන කෙරෙහි විශ්වාසය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය මඟින් එම ආයතනයන්ට අදාළ නීතිමය රාමුව වැඩි දියුණු කිරීම සහ ඒවා අධීක්ෂණයට ලක් කිරීමයි.

ශ්‍රී ලංකාව දියුණු රටවල ඇති ඵලදායිතාවයෙන් වැඩි විදේශ සේවා අවස්ථාවන් සොයා යෑම කළ යුතු කාර්යයක් වී ඇත. පරිගණක වැඩ සටහන් නිෂ්පාදකවරුන් හා හෙදියන් වැනි පුහුණු ශ්‍රමිකයන් සඳහා දියුණු රටවල ශ්‍රම වෙළෙඳපොළෙහි හොඳ ඉල්ලුමක් නොකඩවාම පවතී. මෙම රැකියා අවස්ථාවන් ලබා ගැනීම නොහැකි වී යාමට හේතු වී ඇත්තේ ඉංග්‍රීසි වැනි ජාත්‍යන්තර භාෂා පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහ අදාළ තාක්ෂණික සුදුසුකම් නැතිවීම ය. එහෙත් වත්මන් ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ රටවල් අතර ශ්‍රම ගලනයට වූ සීමා නැති වී යමින් පැවතීම නිසා මෙවැනි රැකියා වෙළෙඳපොළවල් කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම විශේෂයෙන් තරුණයින්ගේ සේවා වියුක්ති ගැටලුව අවම කිරීමේ එක් උපාය මාර්ගයක් වනු ඇත. එම නිසා රැකියා විරහිත උගත් තරුණයන්හට මෙම වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පුහුණුවක් රජයේ යෝජිත පුහුණු වැඩ මුළු මඟින් ලබාදීම තුළින් ඔවුන් මෙම නව රැකියා වෙළෙඳපොළ කෙරෙහි යොමු කරවීම අතිශය වැදගත් වනු ඇත.

(ආ) පසුගිය වර්ෂය සමඟ සසඳන විට 2002 වර්ෂය තුළ විදේශ සේවා නියුක්තිය පැහැදිලි වර්ධනයක් දක්නට ලැබිණි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව 2002 වසරේ ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන් 204 000 ක් වූ අතර මෙය සංසන්දනාත්මකව 2001 වසරේ 184 000 ක් විය. 2001 වර්ෂයේ පළමු භාගයේ රැකියා සඳහා පිට වී යාම් 87 000 ක් හා සසඳන විට 2002 වර්ෂයේ පළමු භාගයේ දී ආන්තික ලෙස ඉහළ අගයක් වූ 90 000 ක් පමණ වුව ද, දෙවන භාගයේ දී බලාපොරොත්තු වූ 108 000 ට වඩා වැඩි වී එය 114 000 ක් විය. සංසන්දනාත්මකව 2001 දෙවන භාගයේ දී රැකියා සඳහා පිට වී ගිය සංඛ්‍යාව 97 000 කි. විදේශ රැකියා සඳහා වැඩි ඉල්ලුම හා 2001 ජූලි මාසයේ ත්‍රස්ත ප්‍රහාරය නිසා ඇති වූ ගුවන් ගමන් අඩුවීම වැනි සිදුවීම් දක්නට නොලැබීම 2002 වර්ෂයේ දෙවැනි භාගයේ දී විදේශ රැකියා සඳහා පිටවීම වැඩි වීමට හේතු විය.

2002 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටව ගිය මුළු පිරිස අතරින් ස්ත්‍රීන්ගේ දායකත්වය සියයට 65 ක් වූ අතර ශ්‍රම කාණ්ඩ අතරින් ගෘහ සේවිකාවන්ගේ දායකත්වය සියයට 53 ක් විය. විදේශ රැකියා නියුක්තිකයන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ඉපයීම් රටෙහි විශාලතම ශුද්ධ විදේශ විනිමය රැස් කරන අංශය වන අතර මුළු විදේශ සේවා නියුක්තියෙහි ගෘහ සේවිකාවන්ගේ දායකත්වය ඉතා ඉහළ අගයක පවතී. මෙලෙස ගෘහ සේවිකාවන් මත රඳා පැවතීම සහ වෙනත් රටවලින් ගෘහ සේවක ඇබෑර්තු පිරවීම නිසා වැඩි වන තරඟකාරිත්වය හමුවේ ගෘහ සේවිකාවන්ගේ සේවා උසස් මට්ටමකට වර්ධනය කිරීම හා ගෘහ සේවිකාවන් වෙනත් ශ්‍රම කාණ්ඩ සඳහා යොමු කිරීම උදෙසා නිපුණතා පුහුණුව ලබා දීමට කටයුතු කළ යුතුයි. කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව ගෘහ සේවිකාවන් සඳහා පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර මේවා මඟින් ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරිත්වයක් ලබා ගැනීම හා නිපුණතා පුහුණු මධ්‍යස්ථාන මඟින් ගෘහ සේවිකාවන් සඳහා පුහුණුව ලබා දී ඔවුන් වෙනත් පුහුණු රැකියා සඳහා යොමු කිරීම 2002 වර්ෂය තුළ දී සිදු කෙරිණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝගය වනුයේ සංක්‍රමණික සේවකයන්ගේ සේවා ස්ථානවල ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරදීම ය. එක් අතකින් ශ්‍රී ලංකා විදේශ

[ 3 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

Competitive Examination for Recruitment of Management Trainees to the Central Bank of Sri Lanka – 2009

**(02) Analytical Writing - English**

*Two hours*

Answer **all** questions.

1. Select **one** of the following topics and write an essay in **250 – 300 words** presenting your ideas analytically and critically.

   (a) It is a responsibility of the Central Bank of Sri Lanka to observe and supervise the functioning of Government and Private Commercial Banks.

   (b) The fluctuations in the banks' rate of interest influence the economic structure of any country.

   (c) The effects of the exodus of skilled labour with talents to foreign countries seeking employment.

   (d) The image of the Sri Lankan woman getting underassessed on account of unnecessary media propaganda.

   (e) The interference of capitalist western nations for the settlement of internal problems in Asiatic and Middle Eastern countries and establishing peaceful co-existence. *(30 marks)*

2. Read the following passage and summarise it to about **one-third of its** present length and suggest a suitable title for it. Indicate the number of words you used at the end of the summary.

   Subsidies are popular means of providing relief by governments to categories of persons (*e.g.* farmers), private agents and public enterprises, enabling them to either purchase or sell a good or a service at a cost below the market price.

   Subsidies are of different types: transfers of budgetary resources, tax holidays, tax concessions, supplying goods or services below cost and policies that create transfers through the market mechanism.

   The welfare cost of subsidies is multi faceted. They lead to governments incurring a budgetary burden, which has to be met through either increased taxing of the population or increasing the government's indebtedness or covering the cost by cutting fiscal expenditure, frequently by reducing expenditure on public investment. Thus, subsidies often involve a serious opportunity cost of growth and development with the reallocation of resources from productive public investment to current expenditure. Furthermore, lower prices, mostly below the cost of production paid by economic agents on goods and services could lead to over exploitation and misallocation of resources. Utilities such as water, electricity and petroleum in many countries are subject to subsidies and those resources are being over exploited. Such over exploitation could lead to a worldwide shortage of resources.

   The key issues in managing subsidies are the size, incidence and distortions in allocation. The adverse implications of subsidies could be minimised by their reduction through provision of subsidies only to the needy through proper targeting. Though the need for reducing subsidies has been recognised, intervention by various pressure groups and insufficient consensus on reforming subsidies, often does not allow the implementation of such policies. Rationalisation of subsidies can remove economic distortions, thereby improving efficiency and growth, reduce the budgetary burden and significantly enhance much needed public investment. *(30 marks)*

[*See page two*